


විදුදය

භාෂා, සාහිත්‍ය, සංස්කෘතික හා මාධ්‍ය අධ්‍යයන ශාස්ත්‍රීය සංග්‍රහය
සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

VIDUDAYA
Journal of Language, Literary, Cultural and Media Studies
Department of Sinhala and Mass Communication, University of Sri Jayewardenepura

2025, 04 (01): 01-06

ISSN: 3051-5424

Journal homepage: https://journals.sjp.ac.lk/index.php/vidudaya

# පශ්චාත් යටත්විජිත සාහිත්‍යය සහ සමාජය

කේ. ඒ. ජේ. පී. කේ. මැදවත්ත

සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
jmedawatte@sjp.ac.lk

## Abstract

Postcolonial literature, a significant literary movement, examines the aftermath of colonialism and its enduring impact on former colonies. The term 'Postcolonialism' broadly refers to how race, ethnicity, culture and human identity are represented in the contemporary era, particularly following the independence of many colonized nations. Postcolonial literature emerged in response to the extensive period of European colonialism, which began in the late 15th century. these colonial enterprises were driven by economic exploitation, political domination and cultural superiority. Colonizers imposed their languages, cultures and systems of governance on the colonized often erasing or marginalizing indigenous traditions and identities.

**Key words:** Literature, Society, Colonialism, Colonizer, Postcolonialism

## 1. හැඳින්වීම

'පොදු රාජ්‍ය මණ්ඩලීය සාහිත්‍යය' නැතහොත් 'නව ඉංග්‍රීසි සාහිත්‍යය' ලෙස නම් කෙරෙන පශ්චාත් යටත්විජිත සාහිත්‍යය, විස්මය දනවන ශාස්ත්‍රීය සාර්ථකත්වය පිළිබඳ කතන්දරයක් පමණක් නොව සුවිශේෂ ඥාන විභාගී (theory of knowledge) ඉදිරි දර්ශනයක්ද සද්භාව විචාරකරණයක්ද පිළිබඳ කැපී පෙනෙන උදාහරණයක් වෙයි. ගෝලීයකරණයත්, ලෝකයේ බටහිරට අයත් නොවන ප්‍රදේශවල පවත්නා සාහිත්‍යික භාවිතයේ ස්වරූපයත් මඟින් පශ්චාත් යටත්විජිතවාදී දේශපාලනික ඇඟවුම් පිළිබඳ ඉඟි කෙරෙන අතර ඒ හේතුවෙන් වර්ධනය වෙමින් පවතින නොසන්සුන්තාවක්ද, වැඩෙමින් තිබෙන බිඳෙනසුලු හා තුනී සම්බන්ධතාවක්ද සමඟ පශ්චාත් යටත්විජිතවාදය මේ දක්වා පැමිණීම අතිශය ජයග්‍රාහී මාවතක් සේ පිළිගැනේ. පශ්චාත් යටත්විජිතවාදී ලේබලය, එය පැලඳිය හැකි පුද්ගලයන්ට වඩා එය නිර්මාණය කළ පුද්ගලයන්ට වඩාත් ප්‍රයෝජනවත් වෙයි. 'පශ්චාත් යටත්විජිතවාදියා' යන්නෙහි දේශපාලනික ඇඟවුම් 'නව යටත්විජිතවාදියා' බවටත් අනාගත භාවිතයේදී 'ප්‍රති යටත්විජිතවාදියා' බවටත් පත්විය හැකිව තිබේ (Goonathilleke, 2001). යුරෝපීය ඓතිහාසිකවාදයේ ස්වරූපය නැවත ලිවීම සහ නැවත කියවීම පශ්චාත් යටත්විජිතවාදයේ මූලික කාර්යයක් වේ. එහිදී යටත්විජිතවාදියා සහ යටත්වැසියා අතර පැවතුණු සම්බන්ධය සුහද මෙන්ම වෛරී සබඳතාවක් ලෙසද අර්ථකථනය කෙරේ (Ashcroft Griffiths and Tiffin, 1989).

පශ්චාත් යටත්විජිත සමාජයෙහි දක්නට ලැබෙන අභ්‍යන්තර දේශපාලන, ආර්ථික, සමාජීය හා සංස්කෘතික ගාමක බලවේග ඒවා ආරම්භ වූ යටත්විජිතවාදී සමාජයේ පටන් දිගු කාලයක් තිස්සේ වර්ධනය වූ ඒවාය. යටත්විජිතවාදියා සහ යටත්වැසියා අතර පැවති තියුණු බෙදීම පශ්චාත් යටත්විජිත සමාජයෙහි ප්‍රබල බලවේගයක් බවට පත් විය. මෙම පසුබිමෙහි ගොඩනැගුණු නව ඉංග්‍රීසි සාහිත්‍යය 'ප්‍රතිරෝධය දැක්වීමේ මූලිකාංගයක්' ලෙසද, 'පශ්චාත් යටත්විජිතවාදී' යන්න 'සංක්‍රමණික' ලෙසද ප්‍රති අර්ථකථනය කෙරේ. ගෝලීයකරණය නිසා සංක්‍රමණිකයන්ගේ සංඛ්‍යාවද ශීඝ්‍රයෙන් ඉහළ යයි. එහෙත් සමස්ත ලෝකයේ වැඩි පිරිසක් සංක්‍රමණිකයෝ නොවෙති. ශීඝ්‍රයෙන් වෙනස්වන සමාජීය හා සංස්කෘතික යථාර්ථය ඉදිරියේ පෙරළා මව්බිමට පැමිණෙන සංක්‍රමණිකයෝ විශාල පිරිසක්ද වෙති. 'ප්‍රතිරෝධය දැක්වීම' පිළිබඳ සංකල්පය වැදගත්කමක් අත් කර ගෙන තිබෙන්නේ මේ සන්දර්භය තුළය. පශ්චාත් යටත්විජිතවාදී විචේචකයෝ බොහෝ දෙනෙක් අධිරාජ්‍යවාදයේ ගොදුරක් ලෙස හෝ ලෝක දේශපාලනයේ විප්ලවකාරී බලවේගයක් ලෙස හෝ තුන්වැනි ලෝකය හඳුන්වා දෙති. එසේම 'ප්‍රතිරෝධය දැක්වීම' පිළිබඳ සංකල්පය පඨිතයෙන් පිටත දේශපාලන හා ඓතිහාසික වර්ධනය තුළ තිරසර ලෙස පිහිටුවීමට උත්සාහ දරා තිබේ (Goonatilleke, 2001). 'ප්‍රතිරෝධය දැක්වීමේ සාහිත්‍යය' යන යෙදුම වඩාත් සංශයවාදී ආකල්පයක් ගන්නා බවද පෙනෙන්නට තිබේ. ප්‍රතිරෝධය දැක්වීමේ සාහිත්‍යයෙහි අවධානය යොමු කරනු ලබන්නේ ලෝකය වෙනස් කිරීමේ බලය ලෙස පිළිගන්නා දේශපාලන කරුණු කෙරෙහිය (Harlow, 1987).

## 2. සාකච්ඡාව

### 2.1.පශ්චාත් යටත්විජිත සාහිත්‍යය

ශ්‍රී ලංකාවේ නිදහසින් පසු යුගය දේශපාලන වශයෙන් විවිධ නිලධාරිවාදද ස්වදේශීය බලපුළුවන්කාරකම්වලද දෘෂ්ටිවාද අනුව ගෙවී යමින් තිබේ. යටත්විජිත විරෝධී පෙරමුණුවලදී හෝ ජාතිකවාදී ව්‍යාපාරවලදී ජනතාව, නව පාලක පන්ති දෘෂ්ටිවාද යටපත් කිරීමට ක්‍රියා කර තිබේ. ප්‍රතිරෝධය දැක්වීමේ සාහිත්‍යය යන යෙදුම පොදුවේ යටත්විජිත විරෝධී සාහිත්‍යය ලෙසද හැඳින්විය හැකි යැයි කියැවෙන්නේ මේ හේතු සාධක අනුවය. එහෙත් සිවිල් සමාජ දේශපාලනය ලොව නොයෙක් ප්‍රදේශවල විවිධ සමාජ මඟින් ගන්නා ලද සුවිශේෂ

නූතනීකරණ ක්‍රියාමාර්ග සමඟ අවියෝජනීය ලෙස බැඳී පවතී. මේ අනුව පශ්චාත් යටත්විජිත ලෝකයෙහි දේශපාලන භාවිතය සම්බන්ධ කවර හෝ සාකච්ඡාවක් අනතුරට ලක් වීමටද ඉඩකඩ ඇත.

ලේඛකයෝ නිතරම පාහේ ද්විත්ව සමාජීය ක්‍රීඩාවක නිරත වෙති. පැරණි සිවිල් සමාජය සෘජුවම ආර්ථික හා දේශපාලන පරායත්තතාව, සංස්කෘතික වශයෙන් අවමානයට පත්වීම හා ජාතික විමුක්තිය පිළිබඳ ප්‍රශ්නයටද මුහුණ දී ඇත. නව සිවිල් සමාජය ප්‍රජාතන්ත්‍රකරණය, බහුත්වවාදය, නව ස්ත්‍රී-පුරුෂ සම්බන්ධතාවල වර්ධනය හා සිවිල් සමාජය ගොඩනැගීම පිළිබඳ ප්‍රශ්නයට මුහුණ දී සිටී. සාමාන්‍යයෙන් සාහිත්‍ය න්‍යාය නව සිවිල් සමාජයට නොව පැරණි සිවිල් සමාජයට ආමන්ත්‍රණය කිරීමට නැඹුරු වී තිබේ. මෙය පශ්චාත් යටත්විජිතවාදී න්‍යාය සම්බන්ධයෙන් මෙන්ම 'ප්‍රතිරෝධය දැක්වීමේ සාහිත්‍යය' සිද්ධාන්තගත කිරීමට දරනු ලබන විවිධ ප්‍රයත්න සම්බන්ධයෙන්ද නිවැරදි වේ.

පශ්චාත් යටත්විජිතවාදී සාහිත්‍යය හා සමාජය පිළිබඳව කෙරෙන සාකච්ඡාවකදී නයිජීරියානු ජාතික චිනුආ අචෙබේ සහ වෝල් සොයින්කා වැදගත් ස්ථානයක් හිමි කර ගනිති. මේ දෙදෙනාම සිවිල් සමාජීය දේශපාලනය පිළිබඳ තදබල මැදිහත්වීමක් සිදුකර තිබේ. චිනුආ අචෙබේ විසින් රචනා කරන ලද Anthills of the Savannah (1987) නමැති නවකතාවේ 'අයිකෙම්' නම් පුවත්පත් කලාවේදියෙකුගේ ප්‍රබල චරිතයක් නිරූපණය වේ. වරෙක ඔහු විශ්වවිද්‍යාලයක පවත්වන දේශනයකදී මෙබඳු අදහසක් ප්‍රකාශ කරයි. "ජයග්‍රාහීව නැගී සිටින ජනතාවගේ පෘථුල, උදාර අනාගත දැක්ම ඔවුන්ගේ පීඩකයාට එරෙහි උදම් රළ ප්‍රවාහයක් බඳුය. ඔවුන්ගේ ලෝකය සහෝදරත්වයේ සහ සාධාරණත්වයේ නව ස්වර්ගයක් හෝ නව මිහිතලයක් බවට පත් කිරීම සිහිනයකි. උදම් රළ ප්‍රවාහය සැබැවින්ම ක්‍රියාත්මක වීමට බොහෝ කලින් නව පීඩකයා රහසිගත ලෙස සූදානම් වෙමින් සිටිනවා ඇත" (Achebe, 1987).

සත්‍යය එය වුවද, සාහිත්‍යය සමාජයෙන් ඉවත් කර ගත නොහැකිය. සැබැවින්ම සාහිත්‍යය මඟින් දේශපාලනික සංඥා කිරීම් නවතාලිය නොහැකිය. වෝල් සොයින්කාද පුරවැසියෙකු සහ ලේඛකයකු ලෙස සිවිල් සමාජ දේශපාලනයෙහි දැඩි ලෙස ක්‍රියාකාරී විය. අවස්ථා ගණනකදී නයිජීරියාවේ මිලිටරි පාලකයන් දැඩි ලෙස විවේචනය කළ ඔහු මෑතකදී බලහත්කාරයෙන් පිටුවහල් කරනු ලැබීය. ඔහු ලියූ සිය පවුලේ චරිතාපදාන මාලාවක් වෙයි. Ake:The Years of Childhood (1981), Isara: A Voyage Around Eassay (1989), Ibadan: The Penkelemes Years: A Memoir 1945-1965 (1994) යන කෘති ඊට අයත් වේ. සිවිල් සමාජ දේශපාලනයට සොයින්කාගේ සහභාගිත්වය විරුද්ධ පාක්ෂික බුද්ධිමතෙකු, ඉහළ නිලධාරියකු හා ලේඛකයකු ලෙස වන ඔහුගේ භූමිකාව ඉක්මවා යයි. ඔහුගේ කෘති මාලාව තම පියාගේ පරම්පරාවේ බුද්ධිමතුන් සමාජය නූතනීකරණය කිරීමට, දකුණු අප්‍රිකානු ව්‍යාපාරික ජීවිතයක් ආරම්භ කිරීමට හා යටත්විජිතවාදී අධිකාරිත්වයට සහ අතිශය පටු සාම්ප්‍රදායිකත්වයටද එරෙහිව තමන්ගේ ජයග්‍රහණ ආරක්ෂා කර ගත යුතුය යන අධිෂ්ඨානය ජීවමාන කරයි.

ඉංග්‍රීසි බසින් ලියැවුණු 'නව සාහිත්‍යය' තුළ සිවිල් සමාජ දේශපාලනය ප්‍රමුඛ වැදගත්කමක් දරන බව ඉතා පැහැදිලිව පෙනීයන කරුණකි. මේ සඳහා ස්වදේශීය ලේඛකයන්ගේ හා ඔවුන්ගේ කෘතිද පාඨක ප්‍රතිචාරද වෙන් වෙන්ව ගෙන සොයා බැලිය යුතුය. එහෙත් පොදුවේ හඳුනා ගත හැකි බොහෝ ලක්ෂණ නව සාහිත්‍යයෙහි මෙන්ම න්‍යායික භාවිතයෙහිද දැනටමත් දැක ගත හැකිය. පශ්චාත් යටත්විජිතවාදී සමාජයත් සාහිත්‍යයත් අතර පවත්නා අවියෝජනීය සහසම්බන්ධය වඩාත් දේශපාලනික ස්වරූපයක් ගන්නා බව පෙනෙන්නට තිබුණද, පුද්ගල ජීවිත ගවේෂණයද, එමගින් සමාජීය කතිකාවක් වෙත එළඹීමද පශ්චාත් යටත්විජිතවාදී ලේඛකයන්ගේ අපේක්ෂාව වේ.

**2.2 පශ්චාත් යටත්විජිතවාදයේ න්‍යායික සීමා**

පශ්චාත් යටත්විජිතවාදී ඥාන විභාගය එක් පසෙකින් කාන්තාවාදයටද, තවත් පසෙකින් පශ්චාත් නූතනවාදයට හා පශ්චාත් ව්‍යුහවාදයටද සීමා වෙයි. පශ්චාත් යටත්විජිතවාදී සාහිත්‍යය, පොදු මානව ධර්මතා සහ ගෝලීයකරණයේ ස්වරූපය විභාග කෙරෙන සන්දර්භවලින් සමන්විත වේ. විවිධ සමාජ පන්ති සහ අන්තර් සංස්කෘතික කාර්යයන්ද, විශේෂයෙන් සමස්ත ලෝකය තුළ කාන්තාව මුහුණදෙන සමාජ පීඩනයේ ස්වභාවයන්ද එම සන්දර්භවල අන්තර්ගත වේ. යටත්විජිතවාදය මඟින් ගෝලීයකරණයට ලක් කෙරුණු සමස්ත ඓතිහාසිකත්වය පශ්චාත් යටත්විජිතවාදය මඟින් ප්‍රශ්න කෙරෙන අතර එමඟින් නිශ්චිත ඉතිහාසයක් හෝ සමාජ ව්‍යුහයක් පිළිබඳ සාකච්ඡාව තවදුරටත් පවත්වා ගැනීම දුෂ්කර කාර්යයක් වෙයි (Boehmer, 2011). මේ අන්දමට ඓතිහාසිකත්වය හා ගෝලීයකරණය වැනි යෙදුම්වල අර්ථ විචාරය යම් රික්තයකින් යුක්ත වන බව පැහැදිලි වෙයි.

නිදහස් අරගල පිළිබඳව ලියැවී ඇති සාහිත්‍යයේ ස්වභාවයද යට කී තත්ත්වය එළිදරව් කරයි. යටත්විජිත ආධිපත්‍යයේ බල අරගලය හා සාහසිකකම්ද පශ්චාත් යටත්විජිතවාදී සාහිත්‍යය මඟින් ප්‍රතිනිර්මාණය වන බැවින් ඒ මත ගොඩනැඟෙන ප්‍රබල තර්ක විතර්කවලින් පශ්චාත් යටත්විජිතවාදයේ සීමා පුළුල් කරනු ලබයි. යටත්විජිතවාදයේ ආගමනයත් සමඟම යුරෝපීය ධනවාදය, කාර්මීකරණය හා සංස්කෘතිය යටත්විජිත රටවල් වෙත පැමිණීමත් එම සමාජීය තත්ත්ව පෙරදිග රටවල සමාජ දේහ මත ආරෝපණය වී බිහිවුණු, ද්විත්ව, නැතහොත්, දෙමුහුන් සමාජීය තත්ත්වය පශ්චාත් යටත්විජිතවාදී ලේඛකයන්ගේ මූලික විෂය ක්ෂේත්‍රයක් බවට පත් වීමත් හේතුවෙන් සමාජීය වපසරියද පුළුල් වනු දක්නට ලැබේ. එසේම යටත් විජිතවාදයේ ආඥාදායක ස්වරූපය තවත් එක් සාධකයකි. ආත්මීයවාදය (subjectvism) මඟින් නිර්මාණයක ස්වභාවය හෙළි වන අතර එමඟින් සිවිල් සමාජයෙහි පුද්ගලයාගේ නිදහස, සමාන ලෙස හෝ සම්පූර්ණ ලෙස හඳුනා ගැනීමට හැකි වේ. ආත්මීය තත්ත්වය සැම විටම දේශපාලනය, ලිංගිකත්වය, ජනවර්ගය, පන්තිය, කුලය හෝ ආගම මඟින් නිර්ණය කෙරේ. සම්පූර්ණ පුද්ගල බවේ වාසි කාන්තාවට නොලැබී යයි. ස්වදේශිකයා ළදරුවෙකු ලෙස සැලකේ. ඔහුට ඡන්ද බලය හිමි නොවේ. ම්ලේච්ඡ දකුණු අප්‍රිකාව සමඟ ඇති අපේ සම්බන්ධය ආඥාදායකත්වයක් දරයි (Nandy,1983). යටත්විජිතවාදයේ මෙම ආඥාදායක ස්වරූපය පශ්චාත් යටත්විජිතවාදයේදී නොපිළිගැනේ. රජයට පිළිගත හැකි වූ එකම සිවිල් සමාජය ඔවුන්ගේ සමාජයයි; යටත්විජිත වැසියන්හට කිසිම විටෙක එහි සමාන සාමාජිකයන් විය නොහැකිය. වර්ණභේදවාදය, ලිංගිකත්වය හා දේශපාලනික වෙනස බලපැවැත්වීම හේතුවෙන් යටත්විජිත වැසියන්හට ගැත්තන් සේ යටහත් පහත් තත්ත්වයෙන් තමන්ගේම රටේ ජීවත් වීමට සිදු විය. ඉන්දියානු ජාතිකවාදී අරගල ආරම්භ වන්නේ සිවිල් සමාජය තුළ ඉන්දියානුවන් දෙවැනි පන්තියේ පුරවැසියන් ලෙස සලකනු ලැබීමේ හේතුවෙනි. එය ඇත්ත වශයෙන්ම ස්වාත්මීය තත්ත්වය රැක ගැනීම වෙනුවෙන් සිදු කෙරුණු අරගලයකි.

ඉතිහාසය පිළිබඳ විමර්ශනයේදී හෙළි වන ලෙසට යටත්විජිතවාදයේද දක්නට ලැබුණේ අසමාන ස්වරූපයකි. ඔස්ට්‍රේලියානු යටත්විජිතවල තත්ත්වය හමුදා පාලනයකට සමාන වූ අතර අප්‍රිකානු සහ ආසියානු යටත්විජිතවල තත්ත්වය පහත්, නොඑසේ නම්, දෙවැනි පෙළ සංස්කෘතියක් ලෙස සලකන ලදි. මෙවැනි වෙනස්කම් යටපත් කරන පශ්චාත් යටත්විජිතවාදී න්‍යාය, බලයේ සහ අසමානත්වයේ කොන්දේසිවලට එරෙහි සදාචාර විරෝධී දේශපාලනික මැදිහත්වීමක් ලෙස ඇතැමුන් අර්ථ දක්වන බැවින් යටත් කර තබා ගැනීම පිළිබඳ අභ්‍යන්තර ඉතිහාසයක් ඇති රටවල සිවිල් සමාජ, පශ්චාත් යටත්විජිතවාදී න්‍යායාත්මක අවබෝධයෙන් බල ගැන්වීම වර්තමානය වන විට අත්‍යවශ්‍ය සාධකයක්ව පවතී.

පශ්චාත් යටත්විජිතවාදය සමාජීය ප්‍රගමනයට දායක වන සාහිත්‍ය න්‍යාය භාවිතයට ගැනීමක් ලෙස කෙරෙන පිළිගැනීමත් සමඟම එය විවිධාකාරයෙන් ප්‍රතික්ෂේප කෙරෙන්නට විය. පශ්චාත් යටත්විජිතවාදය යනු, ඉතිහාසය පිළිබඳ විශ්ලේෂණයක් ලෙස ඇතැමෙකු පිළිගන්නා අතර තවත් අයෙකුගේ අදහස වන්නේ එය විවාදශීලී බවයි

(Gandhi,2011). ඒ අනුව පශ්චාත් යටත්විජිතවාදය විසින් යුරෝපීය යටත්විජිතවාදය ප්‍රශ්න කරනු ලැබීම ඓතිහාසික සමාජ විකාශන සූත්‍රයට එරෙහිව යාමකි. මෙලෙස ඉතිහාසය පිළිබඳ කතිකාවේදී පශ්චාත් යටත්විජිතවාදී පරිච්ඡේදය ලියැවෙනු ඇත්තේ සංකීර්ණ ලක්ෂණ බොහොමයක් සහිතව විය හැකිය. ඉතිහාසය යනු ආධිපත්‍යයයි යන ප්‍රකට කියමන මෙහිදී යළිත් වරක් සනාථ වනු දක්නට ලැබේ (Gandhi,2011).

යටත්විජිත බවට පත් වූ ලෝකයේ රටවල් 'යුරෝපීය' සලකුණ යටතේ එක්සත් වීමක් දක්නට ලැබේ. එයින් සිදු වුයේ විවිධ සංස්කෘති කවර අන්දමේ හෝ සහයෝගී ඒකාග්‍රතාවක් යටත්විජිතවාදය සමඟ ඇති කර ගැනීමය. එය එක්තරා ආකාරයක සහජීවන ක්‍රමයකි. පශ්චාත් යටත්විජිතවාදයට අනුව මෙම තත්ත්වය යටත්විජිත යන වර්ගීකරණය හේතුවෙන් නිර්මාණය වූවකි. පශ්චාත් යටත්විජිතවාදය ඉතිහාසයේ සඳහන් දෙයාකාරයක වාර්තාවලින් නිර්මාණය වී තිබේ. එනම්, යටත්විජිතවාදයේ තිබූ යටත් කර ගැනීමේ බලතල ප්‍රකාශයට පත් වන වාර්තා සහ යටත්විජිතවාදයට ප්‍රතිවිරෝධය පළ කෙරෙන ඓතිහාසික වාර්තා වේ. මේ අනුව පශ්චාත් යටත්විජිතවාදය යනු, යටත්විජිතවාදයේ අත්පත් කර ගැනීම් සහ යටත්විජිත විරෝධී ප්‍රතිවිරෝධතා අතර පිහිටා තිබෙන ව්‍යාපාරයකි (Gandhi, 2011). එහෙත් මෙම අදහසද විවාදාපන්නය. යටත්විජිතවාදියා සහ යටත්වැසියා යන දෙදෙනාගේම අසාර්ථක වීම් සහ දුර්වලතා ඉතිහාසය විසින් එලෙසම වාර්තා කරනු ලැබේද යන්න ගැටලුවකි. සමාජ න්‍යාය කෙටුම්පත් කිරීමේදී ඉතිහාසඥයා, සමාජයක අතීතය අකර්මණ්‍යව ප්‍රතිනිර්මාණය කිරීමෙහි නිරතව සිටිනවා පමණක් නොව, අනාගතය හැඩ ගැස්වීමෙහිද නිරතව සිටි (Chandhoke,1994).

ඉතිහාසයේ කරුණු නිර්මල ආකාරයට නොපවතින නිසාත්, එසේ පැවතිය නොහැකි නිසාත්, ඒවා අප වෙත නිර්මල ලෙස නොපැමිණේ. ඒවා හැම විටම ලියා තබන්නාගේ සිත තුළින් පරාවර්තනය වේ. මේ අනුව ඉතිහාසයෙන් සැමවිටම සත්‍යය අපේක්ෂා කළ නොහැකි බව පැහැදිලි වේ. අතීතය දෙස බලා ඒ යුගය අවබෝධ කර ගත හැක්කේ වර්තමාන ඇසින් පමණි (Carr,1962). ග්‍රන්ථාරූඪ ඉතිහාසය අප එකිනෙකා අවබෝධ කර ගන්නේ අපගේ ශක්ති ප්‍රමාණයෙනි. එබැවින් ඉතිහාස කෘතියක් නිශ්චිත අරුත් ප්‍රකාශ නොකරයි. එසේ නම්, යටත්විජිතවාදී සහ පශ්චාත් යටත්විජිතවාදී ලේඛන පිළිබඳවද මෙම ගැටලුව ඒ ආකාරයෙන්ම පැනනගී. ඉතිහාසයේ මෙම ප්‍රධාන ධාරා දෙකම දේශපාලනික අර්ථයෙන් යුක්ත වන බැවින් ඒවායේ ප්‍රතිඵල සම්බන්ධයෙන් නිශ්චිත අනාවැකි පළ කිරීම දුෂ්කර වන අතර බොහෝ විට සිදු වන්නේ බහුවිධ ප්‍රතිඵල ජනනය කරන අරගල බවට ඒවා පත්වීමයි. සැබෑ ඉතිහාසය බිහි වන ආයතනික වැඩබිම්වල ඇතිවන අරගල ලේඛනගත නොවීම නිසා ඉතිහාසයේ යථා දර්ශය සැඟවී පවතී. පශ්චාත් යටත්විජිතවාදයේ මෙබඳු සීමාද දක්නට ලැබේ.

පශ්චාත් යටත්විජිතවාදයේ තවත් දිගුවක් පිළිබඳව නූතන සාහිත්‍යය සහ සමාජීය ක්ෂේත්‍ර පිළිබඳ විද්වතුන්ගේ අවධානය යොමු වී තිබේ. පළමුවැනි ලෝකයේ ප්‍රාග්ධනය සහ තුන්වැනි ලෝකයේ ශ්‍රම වෙළඳපොළවල් තවදුරටත් ක්‍රියාත්මක වෙමින් පවතී. පශ්චාත් යටත්විජිතවාදය මනඃකල්පිත රාජ්‍යයක් හෝ කාල්පනික නව ලෝකයක් බවට පත්වේද යන සැකය තවදුරටත් බලපැවැත්වේ. අමෙරිකාවේ නව ආක්‍රමණශීලී ස්වරූපය විසින් අධිරාජ්‍යවාදයේ නූතන මුහුණුවර පෙන්නුම් කරන බවට අදහස් පළ වී තිබේ. ගල්ෆ් යුද්ධය ඊට එක් උදාහරණයකි. මේ අනුව යටත්විජිතවාදී හෝ අධිරාජ්‍යවාදි අර්ථවලින් ඔබ්බෙහි පවත්නා සීමා ජය ගැනීමට පශ්චාත් යටත්විජිතවාදයට හැකි වේද යන්න ගැටලුවකි (Gandhi,2011).

**3. සමාලෝචනය**

අද වන විට 'පොදු රාජ්‍ය මණ්ඩලීය සාහිත්‍යය' හෝ 'නව ඉංග්‍රීසි සාහිත්‍යය' නමින් ඇති අධ්‍යයන නිරායාසයෙන් පශ්චාත් යටත්විජිතවාදී අධ්‍යයන බවට පත්ව තිබේ. යුරෝපීය යටත්විජිත වෙත නිදහස ලබා දීමෙන් පසුව මතුවී ආ නව සාහිත්‍යය මගින් නිර්මාණාත්මක ක්ෂේත්‍රයේ මෙතෙක් දක්නට නොලැබුණු විෂය ප්‍රදේශ ගවේෂණය කෙරිණ. යටත්විජිතවාදී ව්‍යුහයත් දේශීය සමාජ ව්‍යුහයත් අතර ඇති වූ සංස්කෘතික ඒකාග්‍රතාව පශ්චාත්

යටත්විජිතවාදී සාහිත්‍යයේදී විසංයෝජනය වනු දක්නට ලැබේ. යටත්විජිතවාදී ව්‍යූහය, භාෂාව සහ සංස්කෘතිය එක් පසෙකිනුත්, දේශීය පදනම්, භාෂාව හා සංස්කෘතිය අනෙක් පසිනුත් ගැබ්ව පවත්නා මෙම නව සාහිත්‍යය මඟින් ජනතාවගේ මනස සිතිවිලි හා අවබෝධය පුළුල් කරන බැවින් එය පොදු ජන චින්තනය සකසන වැඩ බිමක් ලෙස ක්‍රියාකාරී වන බව පැවසේ. මේ අනුව පශ්චාත් යටත්විජිතවාදයේ ශක්‍යතාවන්හි සීමාව ඉතා පුළුල් පරාසයක ව්‍යාප්ත වන බව පැහැදිලි වේ. යුරෝ කේන්ද්‍රීය ඓතිහාසික ප්‍රවාදයෙන්ද අධිරාජ්‍යවාදී බල ව්‍යාප්තියෙන්ද ලෝකයේ පහත් තත්ත්වයකට ඇද දැමුණු යටත්විජිත ජනතාව සමානාත්මතාවෙන්, දේශීය අනන්‍යතාවෙන් සහ ස්වාධීන චින්තනයෙන් නැගී සිටිනු දක්නට ලැබීම පශ්චාත් යටත්විජිතවාදයේ අපේක්ෂාවයි.

## පරිශීලිත මූලාශ්‍රය


*උයන්ගොඩ, ජයදේව. (2000). ශ්‍රී ලංකාවේ පශ්චාත් - විජිත දේශපාලනය තුළ ප්‍රතිසංස්කරණ විරෝධය ගැන විචාරාත්මක අවලෝකනයක්, කොළඹ: සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.*

Achebe, Chinua. (1987). *Anthills of Savannah.* London: Heinemann Publishers.

Ashcroft, Bill, Griffiths, Gareth and Tiffin, Helen. (2000). *Post Colonial Studies - The Kay Concepts*, London: Routledge.

Boehmar, Elleke. (2011). *Colonial and Postcolonial Literature - Migrant Metaphors*, London: Oxford University Press.

Carr, E.H., (1962). *What is History?,* London: Macmillan Publishers.

Chandhoke, Neera. (1994). *Understanding the Postcolonial World- Theory and the Method*, New Delhi: Sterling Publishers.

Gandhi, Leela. (2011). *Postcolonial Theory: An Introduction*, Scotland: Edinburgh University Press.

Goonathilleke, D.C. R.A., (2001). *Perspectives on Postcolonial Literature*, London: Skoob Books.

Harlow, Babara. (1987). *Resistance Literature*, London: Methuen Publishers.

Nandy, Ashis. (1983). *The Intimate Enemy: and Recovery of Self under Colonialism*, New Delhi: Oxford University Press.